කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර) - 2014**

2019 - ජූනි/ජූලි

**B COM E 1035 – මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව - පහයි (05) කාලය : පැය තුනයි (03)

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

ප්‍රශ්න අංක : 01

ගාමිණී ව්‍යාපාරය විවිධ වර්ගයේ භාණ්ඩ නිෂ්පාදනය කරන අතර එම ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලය විසින් පමණක් එම භාණ්ඩ තොග වෙළෙන්දන්ට විකුණනු ලැබේ. එසේම ප්‍රධාන කාර්යාලය පිරිවැයට 25% ක ලාභයක් තබාගෙන භාණ්ඩ ශාඛාවට යවනු ලැබේ. ශාඛාව විසින් භාණ්ඩ මහජනතාවට මුදල් පදනම මත පමණක් විකුණනු ලබයි.

තොග වෙළෙඳුන්ට අදාලව විකුණුම් මිල තීරණය වන්නේ විකුණුම් මිලෙන් 25% ක් වන ලෙසටයි. මහජනතාවට විකුණන මිල තීරණය වන්නේ විකුණුම් මිලෙන් 15% ක දළ ලාභයක් ලෙසටයි.

(එනම්, විකුණුම් මිල ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ පිරිවැය )

පහත සඳහන් ශේෂ පිරික්සුම 2019.03.31 දිනට ව්‍යාපාරයේ පොත් වලින් උපුටා ගන්නා ලදී.

| | ප්‍රධාන කාර්යාලය | | ශාඛාව | |
|---|---|---|---|---|
| | හර | බැර | හර | බැර |
| ගැණුම් - අමුද්‍රව්‍ය | 275,000 | | | |
| සෘජු වැටුප් | 742,500 | | | |
| කම්හල පොදුකාර්ය | 195,000 | | | |
| තොගය 2018.04.01 | | | | |
| අමුද්‍රව්‍ය | 9,000 | | | |
| නිමි භාණ්ඩ | 65,000 | | 46,000 | |
| ණය ගැතියෝ | 185,000 | | | |
| මුදල් | 125,000 | | 5,000 | |

| | | | | |
|---|---|---|---|---|
| පරිපාලන වැටුප් | 80,000 | | 15,000 | |
| විකුණුම් සේවක වැටුප් | 113,000 | | 16,000 | |
| අනෙකුත් පරිපාලන හා විකුණුම් පොදුකාර්යය | 87,000 | | 6,500 | |
| ජංගම හිමිකම් | 20,000 | | | 5,000 |
| ප්‍රාග්ධනය | | 550,000 | | |
| ණය හිමියෝ | | 61,000 | | |
| උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන්කිරීම | | 5,000 | | |
| ජංගම නොවන වත්කම් (ජ/නො/ව) | 550,000 | | | |
| සමුච්චිත ක්ෂය ජ/නො./ව | | 100,000 | | |
| විකුණුම් | | 1,400,000 | | 406,000 |
| ශාඛාවට යැවූ භාණ්ඩ | | 330,000 | | |
| ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ | | | 322,500 | |
| | **2,446,000** | **2,446,000** | **411,000** | **411,000** |

අමතර තොරතුරු:

1. 2019 මාර්තු මස 30 වන දින ශාඛාව රු. 7500 ක් ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කර ඇති අතර මෙම ගනුදෙනුව ප්‍රධාන කාර්යාලයේ පොත් වල මෙතෙක් සටහන් කර නොමැත. එදිනම ප්‍රධාන කාර්යාලය විසින් රු. 7500 ක ඉන්වොයිස් වටිනාකමක් ඇති භාණ්ඩ ශාඛාවට යවා ඇති අතර එම භාණ්ඩ තොගය පිළිබඳ සටහනක් ශාඛාවේ පොත් වල මෙතෙක් සිදු කර නොමැත.

2. 2019 මාර්තු 31 වන දිනට ප්‍රධාන කාර්යාලයේ ඇති අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 11,500 කි.

3. ජංගම නොවන වත්කම් සරල මාර්ග ක්‍රමයට 10% අනුපාතයට වාර්ෂිකව ක්ෂය කළයුතුය. කාලච්ඡේදය තුල ජංගම නොවන වත්කම් මිලදී ගැනීමක් හෝ විකිණීමක් සිදුකර නොමැත.

4. ද්විපාර්ශ්වික ගිවිසුමක් යටතේ ශාඛාවේ සේවකයන් රු. 15000 ක පාරිතෝෂික මුදලකට හිමිකම් කියයි.

ඔබ විසින් තිරු ක්‍රමය යටතේ

I. ප්‍රධාන කාර්යාලයට

II. ශාඛාවට සහ

111. සමස්ථ ව්‍යාපාරයට

2019 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශයක් 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක්, පිළියෙල කරන්න.

(මුළු ලකුණු 30 යි)

ප්‍රශ්න අංක : 02

ඉමදු, තරිදු සහ චමිදු හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් වන අතර ඔවුන් 1/2 , 1/3 හා 1/6 ලෙස පිළිවෙලින් ලාභ අලාභ බෙදා ගනියි. 2018 දෙසැම්බර් 31 වන දින ඔවුන් හවුල් ව්‍යාපරය විසුරුවා හැරිමට තීරණය කරන ලද අතර එදිනට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| ප්‍රාග්ධනය - ඉමදු 517,500<br>තරිදු 431,250<br>චමිදු 316,250 | 1,265,000 | දේපල හා පිරියත | 517,500 |
| තරිදු ලබාදුන් ණය මුදල (පොලිය 5%) | 230,000 | යන්ත්‍ර | 276,000 |
| ගෙවිය යුතු බිල් | 143,750 | ආයෝජන | 241,500 |
| ණය හිමියෝ | 172,500 | තොගය | 227,125 |
| | | ණයගැතියෝ | 333,500 |
| | | බැංකු මුදල් | 215,625 |
| | **1,811,250** | | **1,811,250** |

යන්ත්‍ර රු. 258, 750 ක වටිනාකමකට තරිදු විසින් රැගෙන යන ලදී. ආයෝජන රු. 230,000 ට ඉමදු රැගෙන ගිය අතර දේපල හා පිරියත රු. 546,250 ක වටිනාකමකට චමිදු විසින් රැගෙන යන ලදී. තරිදු ගෙ ණය මුදල සඳහා වසරකට අදාල පොලිය ගෙවිය යුතුය. ඉතිරි වත්කම් පහත පරිදි උපලබ්ධි කරයි.

ණය ගැතියෝ රු. 324,875, තොගය 209,875 යි. ණය හිමියෝ 5 % ක වට්ටමකට යටත්ව පියවනු ලැබීය. ගෙවිය යුතු බිල් රු. 132,250 කට චමිදු විසින් රැගෙන යන ලදී. පොත් වල සටහන් නොවූ රු. 17,250 ක වගකීමකට ගෙවීමට සිදු විය. පොත්වල සටහන් නොවූ කාර්යාලීය පරිගණකය රු. 51,750 කට උපලබ්ධි කරනු ලැබීය. උපලබ්ධි ක්‍රියාවලියට අදාල වියදම් රු. 6900 යි.

ඔබ විසින් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම් ක්‍රියාවලියට අදාලව

i. උපලබ්ධි ගිණුම

ii. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ

ii. බැංකු ගිණුම පිළියෙල කරන්න.

(මුළු ලකුණු 20 යි)

ප්‍රශ්න අංක : 03

අමිල. (A) බුද්ධික(B) හා චතුර (C) පිළිවෙලින් 2 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදාගන්නා හවුල් ව්‍යාපාරයක හවුල් කරුවෝ වෙති. 2018 මාර්තු 31 දින ඔවුන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කර ඇති අතර එදිනට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| ස්කන්ධය හා වගකීම් | | රු. | වත්කම් | රු. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය – A | 656,250 | | පිරියත හා උපකරණ | 437,500 |
| B | 525,000 | | | |
| C | 175,000 | 1,356,250 | | |
| ණයහිමියෝ | | 656,250 | තොගය | 962.500 |
| | | | ණයහිමියෝ | 525,000 |
| | | | අතැති මුදල් | 87,500 |
| | | **2,012,500** | | **2,012,500** |

මෙම හවුල් ව්‍යාපාරය විසිරවූ අතර වත්කම් අනුක්‍රමයෙන් උපලබ්ධි කරන ලද රු. 437,500 ක් පළමුව ද රු. 652,250 ක් දෙවනුව ද රු. 393,750 ක් අවසාන වරටද වත්කම් උපලබ්ධියෙන් ලැබුණි.

සමානුපාතික ප්‍රාග්ධන ක්‍රමය භාවිතා කර ඔබ විසින් පහත දෑ පිළියෙල කළයුතුයි.

1. උපලබ්ධි ගිණුම
2. මුදල් පොත
3. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම
4. උපරිම සාපේක්ෂ ප්‍රාග්ධනය ගණනය පෙන්වන ලේඛනය
5. මුදල් බෙදාහැරීමේ ලේඛනය

(මුළු ලකුණු 20 යි)

ප්‍රශ්න අංක : 04

අ. මූල්‍ය කල්බදු , මෙහෙයුම් කල් බදු වලින් වෙන්කර දක්වන්න.

(ලකුණු 05 )

ආ. අවලංගු කළ නොහැකි කල් බද්දකට අදාල තොරතුරු පහත දක්වේ.

සාධාරණ අගය - රු. 139,110

වාර්ෂික 5 කින් ගෙවිය යුතු වාරිකයේ වටිනාකම - රු. 31,500 පොලි අනුපාතය - 6.6.236%

ඔබ විසින් පහත දෑ ගණනය කළ යුතුයි.

i පොලී ප්‍රමාණය වසර 1 සිට දක්වා වෙන වෙනම

ii ජංගම හා ජංගම නොවන වගකීම

(ලකුණු 15 යි)

(මුළු ලකුණු 20 යි)

ප්‍රශ්න අංක : 05

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව පහත දෑ නිර්වචනය කරන්න.

i. දේපල පිරියත හා උපකරණ
ii. ක්ෂය

(ලකුණු 04 යි)

ආ. සීමිත ආසියානු ප්‍රාග්ධන ආයතනය නව පිරියතක් සවිකරමින් සිටින අතර ඒ සඳහා පහත පිරිවැය දරා ඇත. එම පිරිය අයිතම අතරින් ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 16 ට අනුව ප්‍රාග්ධනිත කළ හැකි පිරිවැය කුමක්ද යන්න තීරණය කරන්න.

- පිරියතට අදාල පිරිවැය (සැපයුම්කරුගේ ඉන්වොයිසියට අදාල පිරිවැය හා බදු) රු. 2,500,000
- මූලික ගෙනඒමේ හා පාලන පිරිවැය රු. 200,000
- ස්ථානය සැකසීමේ පිරිවැය රු. 600,000
- පිරියත අක්පත් කර ගැනීමට අදාල උපදේශන ගාස්තු රු. 700,000
- ප්‍රමාද වූ ගෙවීම් සඳහා සැපයුම්කරුට ගෙවූ පොලිය රු. 200,000 යි.
- වසර 7 ක් අවසානයේ කොටස් ගැලවීමට අදාලව තක්සේරු කළ පිරිවැය රු. 300,000 යි.

(ලකුණු 06යි)

(මුළු ලකුණු 10 යි)